චක්‍රලේඛ අංක:80

අපේ අංකය : සං/1

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

අංක 70 , පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල

2019.05.14

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,

<u>බෝග පුනරුත්ථාපනය (පාලු සැපයීම) යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩි කිරීම</u>

චක්‍රලේඛයේ පරමාර්ථය

1. පාළු සැපයීම සඳහා සුදුසු ඉඩම් වැඩි ප්‍රමාණයක් පාළු සැපයීමට යොමු කර ගැනීම තුලින් කෙටිකාලීනව තේ ඉඩම් වල ඵලදායිතාවය ඉහල නැංවීම.
2. තේ ඉඩම් වල පාළු අවම කිරීම තුලින් වල් මර්ධනය සඳහා වැය වන පිරිවැය අවම කිරීම සහ වල් නාශක භාවිතය අවම කිරීම.

1. බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම) යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල 2019.01.01 දිනට පසුව නිකුත් කරන ලද අවසරපත්‍ර වලට පමණක් බල පැවැත්වෙන ලෙස පහත පරිදි වැඩි කරනු ලැබේ. 2019.01.01 දිනට පෙර නිකුත් කල අවසරපත්‍ර සඳහා 2010.12.31 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක:68 මගින් දැනුම් දී ඇති සහනාධාර වාරික අනුවම ගෙවීම් කල යුතුය.

| වාරිකය | මුදල පැලයකට (රු:) |
|---|---|
| I. වාරිකය - පාලු පැල සැපයීම | 75.00 |
| II. වාරිකය - වර්ෂයක් තුල සිටවූ පාලු පැල නඩත්තු කිරීම. | 25.00 |
| එකතුව | 100.00 |

2. බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම) සඳහා තේ ඉඩම් හිමියෙකුට වසරකට දැනට අවසර ලබා දෙන උපරිම බිම් ප්‍රමාණය අක්කර *01 (හෙක්:0.4047)* සිට අක්කර *02 (හෙක්:0.8094)* දක්වා වැඩි කරනු ලැබේ.
3. සියලුම වගා කලාප සඳහා අක්කරයකට (ඒකරාශි වූ හෝ විසිරි පාළු තනි තනිව පවතින) පැල 1000ක් දක්වා අවසරපත්‍ර නිකුත් කල හැකිය.

4. පාළු සැපයීම සඳහා ඉල්ලුම්කරන තේ වගාව අවම වශයෙන් පැල සිටුවා වසර 04 ක් සම්පූර්ණ කර පළමුවන කප්පාදුවට එළඹ තිබිය යුතුය. තවද එම ඉඩම පුනරුත්ථාපනය කිරීම තුලින් ඉදිරි වසර 10 ක් තුල සාර්ථක ලෙස අස්වැන්න ලබාගැනීමේ හැකියාව තිබිය යුතු අතර,මේ යටතේ සහනාධාර ලබාගත් ඉඩම් වෙත වසර 10 ක් ගතවන තුරු නැවතත් පාළු සැපයීමට හෝ තේ නැවත වගාව සඳහා සහනාධාර ලබා නොදිය යුතුය.

5. පස සාරවත් කිරීම සඳහා පාළු සහිත ස්ථාන වල මානා තෘණ අවම වශයෙන් වසර 1 ½ කට නොඅඩු කාලයක් වගා කොට නඩත්තුකර තිබූ බව තහවුරු කල යුතුය එසේ නොමැතිනම් පැල සිටුවන අවස්ථාවේදී එක වලකට කොම්පෝස්ට් කි.ග්‍රෑම් 2 බැගින් පස් සමග මිශ්‍රකර යොදා ඇති බවට පරීක්ෂණ වාර්තාව මගින් සනාථ විය යුතුය.

6. පාළු සපයන බිම් කොටසේ තේ පඳුරු පාළු සිටුවීම සිදු කරනු ලබන කන්නය තුල කප්පාදුවට භාජනය විය යුතුය. එම කප්පාදුව නිර්දේශිත පිළිවෙත්වලට අනුකූල විය යුතුය.පාළු සිටුවීම සඳහා ජම්බෝ පැල යොදා ගන්නේ නම් පමණක් කප්පාදුකර වසරක් ඇතුළත පාළු සැපයීම සඳහා අවසර ලබාදිය හැකි අතර, එහිදී පාළු සිටුවන ස්ථානය වටේ ඇති තේ පඳුරුවල අතු පැහීමක් කර පැල සිටුවීම කළ යුතුය.

7. පාළු පැල සිටුවීමට අමතරව අවසරපත්‍රය නිකුත් කරන බිම් කොටසේ පාළු සපයන අවස්ථාවේදී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරමින් පහත අවශ්‍යතාද සම්පූර්ණකර තිබිය යුතුය.

- කාණු පද්ධතිය / ගල් වැටි පිළිසකර කිරීම.
- සෙවන නියමිත පරතරයේ ස්ථාපිත කර තිබීම සහ කප්පාදු කිරීම.
- වල්පැල පාලනය.

මෙම චක්‍රලේඛය ලද බවත් , ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථ කල යුතුය. තවද සියලුම කාර්ය මණ්ඩලය මේ පිළිබඳව දැනුවත් කල යුතු අතර, දැන්වීම් පුවරුවේ දැන්වීම ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කරන්න

දේශබන්ධු විජේරත්න දෙවගෙදර

සභාපති

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) / (ව්‍යාප්ති)
2. අභ්‍යන්තර විගණක
3. මුදල් කළමනාකරු
4. කළමනාකරු සැළසුම් /නියමුකරණ
5. සියලුම මාණ්ඩලික නිලධාරීන්
6. සියලුම කළාප තේ සංවර්ධන නිලධාරීන්
7. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
8. ගරු ලේකම් /ගරු සභාපති සමස්ත ලංකා සමිති සංවිධානය
9. ගරු ලේකම් /ගරු සභාපති සියලුම ප්‍රාදේශීය සංවිධාන